# කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය ( අධ්‍යයන ධාරා)
## පළමු සෙමෙස්තරය -2019
## SLG 2119 – නිර්මාණාත්මක ලේඛනය

(පැ දෙකයි)

ප්‍රශ්න **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

---

01. "ශාස්ත්‍රීය ලේඛනය" හා "නිර්මාණාත්මක ලේඛනය" සතු ලක්ෂණ නිදසුන් ඇසුරින් පැහැදිලි කරමින් , වත්මනෙහි මේ දෙඅංශයෙහි විද්‍යමාන "සාධනීය ලක්ෂණ" ඔබ කැමති කතුවරුන් කිහිපදෙනෙකුගේ නිර්මාණ ආශ්‍රය කරගෙන පැහැදිලි කරන්න.

02. "කථනය සහ රූපණය" සාහිත්‍ය කලා නිර්මාණවල කලාත්මක අගය සඳහා ඉවහල් වන අන්දම ප්‍රබන්ධ කථා කලාව ආශ්‍රයෙන් විග්‍රහ කරන්න.

03. "නිර්මාණකරණයේදී නිර්මාණකරුවෙකුගේ අත්දැකීම් අත්‍යන්තයෙන් ම වැදගත් වන නමුත් " පරිකල්පන ශක්තිය " නිර්මාණයක සාර්ථකත්වය උදෙසා මූලික වන්නේය." නිදසුන් ඇසුරින් විමසන්න.

4. "නිර්මාණකරණයේදී නිර්මාණකරුවන් ඇතැම් විට ඓතිහාසික මූලාශ්‍ර ඉවහල් කර ගන්නා නමුත් නිර්මාණයක් සාර්ථක වන්නේ ප්‍රතිනිර්මාණ කාර්යයේ දී කුළු ගන්වන දෘෂ්ටිය හේතුවෙනි" මේ නිගමනය ගැන ඔබේ අදහස් දක්වන්න.

5. " ප්‍රචාරණ කලාවේ දියුණුව හෝ විකාශනය හේතුවෙන් නිර්මාණකරණයේ අභිමතාර්ථ වත්මනෙහි වෙනස් වී ඇත. " මේ මතය ඉදිරිපත් කිරීමට ඉවහල් වන මූලික සාධක විග්‍රහ කරන්න.

6. "විශේෂාංග රචනය" සන්නිවේදන මාධ්‍ය පුළුල් වීම සමග වැඩි වර්ධනය වී තිබෙන තත්වයක් විදහාපාන බව පිළිගත හැකි නමුත් විශේෂාංග රචනා කලාව ජන සමාජයක ජීවන පුරුෂාර්ථ සාධනීය මට්ටමකින් ඔසවා තැබීමට සමත් වී තිබේදැයි විචේචනාත්මක ව විභාග කරන්න.

*********************